සියළුම හිමිකම් ඇවිරිණි /All Rights Reserved

**Royal College - Colombo 07**

රාජකීය විද්‍යාලය - කොළඹ 07

**Grade 9– 1st Term Test – April 2025**

පළමු වාර පරීක්ෂණය - 9 ශ්‍රේණිය - 2025 අප්‍රේල්

කාලය : පැය 1 1/2
Time: 1 1/2 hours

# ඉතිහාසය

Name: - ............................................ Class: -................ Index no: - ....................

## I කොටස

❖ සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න

❖ අංක 01 සිට10 දක්වා ඇති සියලුම ප්‍රශ්නවලට අදාළ වඩාත් සුදුසු පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න

1. 16 වන සියවසේ දී ලන්දේසීන්ට ඉතා වැදගත් වූ පෘතුගාලයේ පිහිටි වරාය මින් කුමක්ද?
(1) ලන්ඩන් (2) ලිස්බන් (3) කොන්ස්තන්තිනෝපල් (4) කැලිකට්
2. ලන්දේසීන්ගේ මව් රට වූ ඕලන්දය 16 වන සියවසේ දී යටත් කරගෙන සිටි යුරෝපා ජාතිකයන් දැක්වෙන නිවැරදි පිළිතුර තෝරන්න.
(1) ප්‍රංශය (2) බ්‍රිතාන්‍යය (3) පෘතුගාලය (4) ස්පාඤ්ඤය
3. ජොරිස් වැන් ස්පිල් බර්ජන් නමැති ලන්දේසි ජාතික අද්මිරාල්වරයා මඩකලපුවේ දී හමුවූ උඩරට රජු කවුරුන්ද ?
(1) I වන රාජසිංහ රජුය (2) II වන රාජසිංහ රජු ය
(3) I වන විමලධර්මසූරිය රජුය (4) II වන විමලධර්මසූරිය රජුය
4. ලන්දේසි යුගයේ සිවිල් පරිපාලනයේ පහළ තනතුරු සඳහා දේශීය නිලධාරීන් යොදාගත් අතර යාපන ප්‍රදේශය සඳහා යොදාගත් නිල නාමයක් වනුයේ
(1) කංකානම් (2) කෝරාළ (3) විදානේ (4) ගම්මුලාදෑනි
5. පෘතුගීසීන්.......................... දී ශ්‍රී ලංකාවේ ගාලු වරායට සේන්දු විය.
(1) ක්‍රි. ව. 1498 (2) ක්‍රි. ව 1595 (3) ක්‍රි. ව. 1505 (4) ක්‍රි. ව.1658
6. උපසම්පදාව පිහිටුවීමට උපාලි හිමියන් ප්‍රමුඛ භික්ෂූන් වහන්සේලා පිරිසක් මෙරටට වැඩම කරවන ලද රජු දැක්වෙන පිළිතුර නම්
(1) ශ්‍රී විජය රාජසිංහ රජු (2) රාජාධි රාජසිංහ රජු
(3) කීර්ති ශ්‍රී රාජසිංහ රජු (4) ශ්‍රී වික්‍රමරාජසිංහ රජ
7. පෙරදිග ඉංග්‍රීසි වෙළඳ සමාගම විසින් මෙරට මුහුදුබඩ ප්‍රදේශවල බදු එකතු කිරීම සඳහා අවුමිල්දාර් නම් නිලධාරීන් ගෙන්වන ලද්දේ
(1) බ්‍රිතාන්‍යයෙන්ය (2) ඕලන්දයෙන්ය (3) පෘතුගාලයෙන් ය (4) මද්‍රාසියෙන් ය
8. ක්‍රි. ව. 1797 කැරැල්ලට බලපෑ බදු වර්ගයක් නොවන්නේ මින් කුමක්ද?
(1) මාළු බද්ද (2) දුම් කොළ බද්ද (3) පොල්ගස් බද්ද (4) ඇඟ බද්ද
9. ක්‍රි. ව. 1803 උඩරට ආක්‍රමණය සිදුවන අවධියේ දී මෙරට සිටි ඉංග්‍රීසි ආණ්ඩුකාරවරයා වූයේ
(1) විලෙන් පැල්ක් (2) ෆෙඩ්රික් නෝර්ත් (3) තෝමස් මේට්ලන්ඩ් (4) රොබට් බ්‍රවුන්රිග්
10. ක්‍රි. ව. 1818 නිදහස් සටනට නායකත්වයේ දීම සඳහා උඩරට රජු ලෙස පෙනී සිටි තැනැත්තා වූයේ
(1) දොරේසාමි (2) මුත්තුසාමි (3) බුටෑවේ රටේරාළ (4) ඩිංගිරාළ

❖ 11 සිට 15 දක්වා ප්‍රකාශ හරි නම් (✓) ලකුණ ද වැරදි නම් (×) ලකුණද වරහන තුළ යොදන්න

11. රාජාධි රාජසිංහ රජුගේ අභාවයෙන් පසු කන්නසාමි කුමරා ශ්‍රී වික්‍රම රාජසිංහ ලෙස රජ විය. ( )
12. පිළිමතලව්වේ මහාධිකාරම්වරයාගේ මරණයෙන් පසුව හිස් වූ මහාධිකාරම් ධුරය සඳහා මොල්ලිගොඩ පත් කරන ලදි. ( )
13. ඉංග්‍රීසි පාලන අවධියේ දී මෙරටට පැමිණි පළමු ආණ්ඩුකාරවරයා වූයේ ෆෙඩ්රික් නෝර්ත් ය. ( )
14. කැප්පෙටිපොළ නිලමේතුමා විසින් 1818 කැරැල්ල සිදුවන අවස්ථාවේ දී ඌව වෙල්ලස්ස සටන්කරුවන්ට නායකත්වය සපයන ලදී ( )
15. ක්‍රි.ව.1818 කැරැල්ල අවසානයේ දී ඒ පිළිබඳව සොයා බැලීමට ද වියුරන් නම් කොමිසම පත්කර එවන ලදී. ( )

❖ 16 සිට 20 දක්වා ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර වරහනින් තෝරා හිස්තැන මත ලියා දක්වන්න.

16. ශ්‍රී වීර පරාක්‍රම නරේන්ද්‍රසිංහ රජු .................................... කුමරා නමින් ද ප්‍රකට විය.
(මුත්තුසාමි, කුණ්ඩසාලේ)



Download more papers at e-Kalvi.com

17. ලන්දේසීන් .................................. භක්තිකයන් විය.(රෙපරමාදු,රෝමානු කතෝලික)
18. පෘතුගීසි පාලන අවධියේ සිට කුරුඳු එකතු කිරීම සඳහා ..........................නම් දෙපාර්තමේන්තුව පවත්වාගෙන ගොස් ඇත. (බද්දෙ ,මහ බද්දේ )
19. උසස් අධ්‍යාපනය ලන්දේසි භාෂාවෙන් ලබාදීම සඳහා ලන්දේසීන් විසින්..........................නම් පාසල් විශේෂයක් ආරම්භ කරන ලදී.(සෙමනේරි,ඉස්කෝල)
20. ඉංග්‍රීසි ජාතික ..............................නැමැත්තා ක්‍රි. ව. 1762 දී රාජ්‍ය දූතයෙකු ලෙස උඩරට රාජධානියට පැමිණියේය. ( සිබෙල් ද වර්ට්, ජෝන් පයිබස්)

(ලකුණු 20× 2= 40 )

## II කොටස

❖ ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.

1. පහත සඳහන් සිතියම් වල අක්ෂරවලින් දී ඇති ස්ථාන හඳුනාගෙන වරහනින් තෝරා අදාල අක්ෂරය ඉදිරියෙන් ලියා දක්වන්න(යාපනය ,කොළඹ, ගාල්ල, මහනුවර,ත්‍රිකුණාමලය, කල්පිටිය,මඩකලපුව) (ප්‍රංශය, එංගලන්තය,ඕලන්දය ,ස්පාඤ්ඤය, ජාවාද්වීපය, පෘතුගාලය)




A...............

B...............

C...............

D...............

E...............

F...............

G...............




H .................

A



1.A රූපයේ දැක්වෙන රජු නම් කරන්න..........................

2.මෙම රජු ගේ රාජධානිය කුමක්ද?..........................................

3.මෙතුමා විසින් යුරෝපා ජාතියක ගේ සහාය ඇතිව ලංකාවෙන් පලවා හරින ලද යුරෝපා ජාතිය නම් කරන්න.......................

4.ලන්දේසීන් හා මෙම රජු අතර ලිපි ගනුදෙනුවල දී රජු හැඳින්වීමට ඔවුන් යෙදූ නාමය කුමක්ද?............................................

B



1.B රූපයේ සිටින රජ බිසව නම් කරන්න............................

2.ඇය කවර රජ කෙනෙකුගේ බිසවක් ද?...............................

3.මෙම රජ බිසව හා රජු ඉංග්‍රීසින්ගෙන් බේරීම සඳහා සැඟව සිටි ස්ථානය නම් කරන්න...........................................

4.මෙම බිසව ඇතුළු පිරිස ඉන්දියාවේ කවර ප්‍රදේශයකට පිටුවහල් කරනු ලැබුවේ ද?...............................................

ලකුණු 08+04+04 =16

2. I) ඕලන්දයේ සිටි රජු විසින් පෙරදිග ඕලන්ද වෙළඳ සමාගම වෙත රාජකීය බලපත්‍රයට අනුව පවරන ලද බලතල දෙකක් ලියන්න. ( ලකුණු 02)

II) ක්‍රි. ව.1638 දී එවකට උඩරට රජු ලෙස කටයුතු කළ දෙවන රාජසිංහ රජු ලන්දේසීන් සමග අත්සන් කළ ගිවිසුමට අයත් ප්‍රධාන කරුණු දෙකක් ලියන්න. ( ලකුණු 04)

III ) A) ලන්දේසීන් විසින් මුහුදුබඩ ප්‍රදේශයේ පාලනයේ පහසුව සඳහා ප්‍රදේශ තුනකට වෙන් කරනු ලැබීය. එම ප්‍රදේශ තුනෙන් දෙකක් නම් කරන්න ( ලකුණු 02)

B)ලන්දේසීන් විසින් මෙරට දී ක්‍රියාත්මක කරන ලද තෝම්බු වර්ග තුනක් නම් කරන්න. ( ලකුණු 03)

3. I) පහත සඳහන් ලන්දේසි දූතයන් පැමිණි කාලයේ දී උඩරට රාජ්‍යයේ පාලන කටයුතු මෙහෙයවූ රජවරුන් වරහන තුළින් තෝරා ලියන්න.

A - කොරනේලියස් වැකල් B- කලන් අල්බස්

( I වන විමලධර්මසූරිය රජු ,II වන විමලධර්මසූරිය රජු ,ශ්‍රී වීර පරාක්‍රම නරේන්ද්‍රසිංහ රජු )

( ලකුණු 02)

II) ලන්දේසීන් විසින් මෙරටදී අමතර ආදායමක් ලබා ගැනීම සඳහා අනුගමනය කළ ක්‍රියාමාර්ග 2 ක් ලියා දක්වන්න. ( ලකුණු 04)

III ) ලන්දේසීන් විසින් නව උසාවි පද්ධතියක් හඳුන්වා දෙනු ලැබීය.එම උසාවි පද්ධතියට අයත් උසාවි වර්ග තුනක් නම් කර ඉන් එක් උසාවි වර්ගයක් පිළිබඳව කෙටියෙන් පැහැදිලි කරන්න.

( ලකුණු 05)

4. I) ත්‍රිකුණාමල වරාය බ්‍රිතාන්‍යයන්ට වැදගත් වීමට හේතු වූ කරුණු දෙකක් ලියන්න. (ලකුණු 02)

II) පහත සඳහන් ප්‍රශ්න සඳහා කෙටි පිළිතුරු ලියන්න

A -ක්‍රි. ව.1796 වර්ෂයේ දී ඉංග්‍රීසීන් ශ්‍රී ලංකාවට පැමිණෙන විට උඩරට සිටි රජු නම් කරන්න.

B- ප්‍රංශය ඕලන්දය ආක්‍රමණය කරන අවස්ථාවේ ඕලන්දයේ සිටි රජු කවුරුන්ද?

C - මෙරට සිටි අවසාන ලන්දේසි ආණ්ඩුකාරවරයා නම් කරන්න.

D -ත්‍රිකුණාමලයේ පැවති ලන්දේසීන්ගේ බළකොටුව හැඳින්වූ නම කුමක්ද? (ලකුණු 04 )

III ) A- ක්‍රි. ව. 1803 දී උඩරට ආක්‍රමණය කරන අවදියේ සිටි උඩරට රජුන් නම් කරන්න. (ලකුණු 01)

B- ක්‍රි. ව. 1803 දී ඉංග්‍රීසීන් උඩරට ආක්‍රමණය කිරීමට හේතු වූ කරුණු හතරක් ලියා දක්වන්න.

(ලකුණු 04)

5. I) ජෝන් ඩොයිලි සබඳතා පැවැත්වූ උඩරට සිටි ප්‍රධාන පෙළේ රදළවරුන් දෙදෙනෙක් නම් කරන්න

(ලකුණු 02)

II) උඩරට ගිවිසුමට සම්බන්ධ පහත සඳහන් ප්‍රශ්න සඳහා පිළිතුරු ලියන්න.

A) උඩරට ගිවිසුම අත්සන් කළ වර්ෂය ලියන්න

B) එම ගිවිසුම අත්සන් කළ ස්ථානය ලියන්න

C) ගිවිසුම අත්සන් කිරීමට පෙර ඉංග්‍රීසි කොඩිය එසවූ අවස්ථාවේ එය පහත හෙළා සිංහල කොඩිය එසවූ භික්ෂුවගේ නම කරන්න

D) උඩරට ගිවිසුම අත්සන් කරන අවදියේ මෙරට සිටි ආණ්ඩුකාරවරයා කවුරුන්ද? (ලකුණු 04 )

III ) ක්‍රි. ව. 1818 දී ඇතිවූ නිදහස් සටනට හේතු වූ කරුණු 5ක් ලියා දක්වන්න (ලකුණු 05)